**2022මැයි මස 17වනදිනපැවති**

**හතළිස්නවවනමහ සභා රැස්වීමේ කෙටුම්පත් වාර්තාව**

දිනය :-2022.05.17

ස්ථානය:- නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව

වේලාව :- පෙ.ව10.00

සහභාගී වූ:-

| | | | |
|---|---|---|---|
| 01. | ගරු සභාපති | එස්.බී කුමාරදාස මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| 02. | ගරු උප සභාපති | එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| 03. | ගරු මන්ත්‍රී | කේ.ඒ ශාන්ත මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| 04. | ගරු මන්ත්‍රී | ජේ.ඒ.ඩී විමලසිරි මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| 05. | ගරු මන්ත්‍රී | පී.ටී සිරිසේන මැතිතුමා | (ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| 06. | ගරු මන්ත්‍රී | ජේ.ඒ ජයවර්ධන මැතිතුමා | (ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| 07. | ගරු මන්ත්‍රී | බී.ඒ.ජී.එම්.කේ.ජී.ජී කුමාරි මැතිනිය | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| 08. | ගරු මන්ත්‍රී | ඩී.පී බන්දුලසේන මැතිතුමා | (ශ්‍රී.ල නි.ප) |
| 09. | ගරු මන්ත්‍රී | ආර්.එම් කුමාරසිංහ මැතිතුමා | ( එ.ජා.ප) |
| 10. | ගරු මන්ත්‍රී | ජී.ඒ නෙළුම් මැතිනිය | (එ.ජා.ප) |
| 11. | ගරු මන්ත්‍රී | ආර්.එම්.අයි ජනක ශ්‍රීමාලි මැතිනිය | (එ.ජා.ප) |
| 12. | ගරු මන්ත්‍රී | පී කරුණාරත්න මැතිතුමා | ( ශ්‍රී.ල නි.ප) |
| 13. | ගරු මන්ත්‍රී | එස්.ඒ.කේ.පී ගුණවර්ධන මැතිතුමා | ( ජ.වි.පෙ) |
| 14. | ගරු මන්ත්‍රී | ඩී.එම්.එන් සුභාෂිණී බංඩාර මැතිනිය | ( එ.ජා.ප) |
| 15. | ගරු මන්ත්‍රී | වයි.එම් ගාමිණී බංඩාර මැතිතුමා | (ස්වාධීන කණ්ඩායම) |

දන්වා සහභාගී නොවූ:-

| | | | |
|---|---|---|---|
| 01. | ගරු මන්ත්‍රී | පී.එස්.බී සිරිවර්ධන මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| 02. | ගරු මන්ත්‍රී | කේ. හැරිසෙන්ස් මැතිතුමා | ( ජ.වි.පෙ) |
| 03. | ගරු මන්ත්‍රී | බී.බී.ඊ ගයාන් චාමර මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| 04. | ගරු මන්ත්‍රී | කේ.ඒ සංජීව මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| 05. | ගරු මන්ත්‍රී | එච්.ඩබ්.ජී.එන් කුමුදු වසන්ති මැතිනිය | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ |

නොදන්වා සහභාගී නොවූ:-

| | | | |
|---|---|---|---|
| 06. | ගරු මන්ත්‍රී | එම්.ඒ විමලසුරේන්ද්‍ර මැතිතුමා | ( එ.ජා.ප) |

නිළධාරීන්:-

01. ලේකම් බී.එච් ප්‍රදීප් නිශාන්ත මයා
02. විෂය භාර කළමණාකරන සේවා නිළධාරී කේ.ජී.ඒ සම්මානි මෙය

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීතුමන්ලාහා ගරු මන්ත්‍රීතුමියන්ලා වෙත සුභ උදෑසනක් ප්‍රාර්ථනය කරමින්, ඉතාම ආදරයෙන් ගෞරවයෙන් පිළිගනිමින් න්‍යායපත්‍රානුකූලව සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී

**අ) මහ සභා වාර්ථාව සභා සම්මත කර ගැනීම.**

**<u>2022.04.17 මහ සභා කෙටුම්පත් වාර්ථාව</u>**

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u>2022.04.17 වන දින පැවැත් වූ මහ සභා රැස්වීමේ කෙටුම්පත් වාර්තාව ප්‍රාදේශීය සභා රීතීන්ට අනුව ඔබ වෙත ලැබීමට සලස්වා ඇති බැවින් එම වාර්තාවේසංශෝධන ඇත්නම් සංශෝධනයන්ට යටත්ව සභා වාර්ථාව සම්මත කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

<u>සංශෝධන</u>

<u>ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා</u>ගියවර තමන් ප්‍රකාශ කලේ වර්තමාන ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ලෙස නොව අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා යනුවෙනි.එබැවින් එය සංශෝධනය විය යුතුය.තවද, නිළධාරීන් ලෙස තමා පැවසුවේ සියලුම නිළධාරීන් නොව තෝරාගත් නිළධාරීන් පිළිබදව බවද සඳහන් කරන ලදී.

<u>ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා</u>2022.04.17 දින පැවති මහ සභාවේ කෙටුම්පත් වාර්ථාව සංශෝධන යන්ට යටත්ව සභා සම්මත කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා කල යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව කෙටුම්පත් වාර්තාව සම්බන්ධයෙන් ඉදිරිපත් වූ සංශෝධන වලට යටත්ව 2022.04.17 වන දින මහ සභා රුැස්වීම් කෙටුම්පත් වාර්ථාව සංශෝධන සහිතවසභා සම්මත විය.

**ආ) සභාපතිතුමන් විසින් කරනු ලබන විශේෂ නිවේදනය.**

**නැත.**

**ඇ) ප්‍රාදේශීය සභාව වෙත අමතා එවන ලද සංදේශ පෙත්සම්, පැමිණිලි සහ සන්නිවේදන**

**නැත.**

**ආ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්ණ**

**නැත.**

**ඉ) යථා පරිදී කල් දී ඇති යෝජනා**

**01. 2022 ජූනිමස සේවකයින්ගේ අතිකාල තක්සේරු වාර්ථා අනුමත කිරීම.**

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> 2022 ජූනි මසට අදාලව කාර්යය මණ්ඩලය විසින් අතිකාල ඉල්ලීම් කර ඇති අතිකාල තක්සේරු වාර්ථාසභාවට ඉදිරිපත් කරමින් අදාල සේවකයින් වෙත අතිකාල තක්සේරු වාර්තා අනුමත කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

**<u>2022 ජූනි</u>**

| | | |
|---|---|---|
| | | **පැය ගණන** |
| 01. අයි.ජී.සී.එන් වීරකෝන් මිය | (කළ.සේවා නිළධාරී) | 60 |

| | | |
|---|---|---|
| 02. එස්.එම් මහරගෙදර මිය | (සහකාර ගිණුම් නිළධාරී) | 60 |
| 03. එම්.එස්.එම් ගුණවර්ධන මිය | (කළ: සේවා නිළධාරී) | 60 |
| 04. කේ.ජී.ඒ සම්මානි මිය | (කළ.සේවා නිළධාරී) | 60 |
| 05. කුමුදු වාසනා වීරසිංහ මිය | (කළ සහකාර (ආවරණ) | 60 |
| 06. ටී.එච්.ආර් තාරක මයා | (කළ සහකාර (ආවරණ) | 40 |
| 07. කේ.ජී.ජී.ඩී ගමගේ මිය | (පුස්තකාල සහායක) | 40 |
| 08. මානෙල් පුෂ්පකුමාරි මිය | (පුස්තකාල සහායක) | 40 |
| 09. ඒ.ඒ පියතිස්ස මයා | (මා.කම්කරු (මුරකරු ආවරණ) | 40 |
| 10. ටී.එච්.ඩී.ඩී පෙරේරා මයා | (මුරකරු(ආවරණ) | 75 |
| 11. එම් ආර්.පෙරේරා මයා | (මුරකරු) | 75 |
| 12. එස් අන්තෝනි මයා | (මාර්ග කම්කරු) | 40 |
| 13. සුභාෂ් ගයාෂාන් මයා | (අනියම් රියදුරු) | 40 |
| 14. බන්දුල දිසානායක | (මුරකරු ආවරණ) | 75 |
| 15. ජේ.එම්.ජේ.ආර්.කේ ජයසුන්දර මයා | (විදුලි කාර්මික) | 40 |
| 16. ඩබ් තිලකරත්න මයා | (කා.කා.සහයක) | 40 |
| 17. දීපාල් ගමගේ මයා | (සෞඛ්‍ය කම්කරු) | 40 |

<u>ගරු මන්ත්‍රීඩී.පී බන්දුලසේන මැතිතුමා</u> 2022 ජූනි මසට අදාල අතිකාල ඉල්ලුම් කර ඇති සේවකයින්ගේ අතිකාල තක්සේරු වාර්ථා අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපති තුමා කල යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> අතිකාල තක්සේරු වාර්තා අනුමත කිරීමේ යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතීද යන්න විමසූ අතර කිසිදු විරෝධතාවයක් ඉදිරිපත් නොවූ බැවින් 2022 ජූනි මසට අදාල අතිකාල ඉල්ලුම් කර ඇති සේවකයින්ගේ අතිකාල තක්සේරු වාර්ථා අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපති තුමා කල යෝජනාව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.

**02.ආභාධිත පුද්ගලයින් සඳහා වැසිකිළි ආධාර ලබා දීම.**

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u>නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභා බල ප්‍රෙදේශයේ පදිංචි ආබාධිත පුද්ගලයින් විසින් කොමඩ් වර්ගයේ වැසිකිළි පෝච්චි හා උපාංග ලබා දෙන ලෙස තමා වෙතින් කරන ලද ඉල්ලීම් වරින් වර මහ සභාවට ඉදිරිපත් කරමින් සභා සම්මත කර ගෙන ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා යොමු කල අතර, ප්‍රාදේශීය සභා පනතේ 19 යේ 23 වගන්තියට අනු

ව මෙම ආධාර ලබා දීමට නෛතික ප්‍රතිපාදන සැකසී ඇති බැවින් 2022 වර්ෂයේ වැසිකිළි ආධාර ලබා දීමේ වැඩසටහන යටතේ එලෙස ඉල්ලීම් කල පහත සඳහන් පුද්ගලයින් වෙත වැසිකිළි ආධාර ලබා දීම සුදුසු බවට යෝජනා කරන ලදී.

- පළාඩිකුලම කුසුම්සිරි මහතා
- බණ්ඩියාලංකුලම, 5 කණුව පදිංචි බී පියදාස මයා
- තම්මැන්නාපුර, බී.ඊ.ටී සඳමාලි මිය
- කලත්තෑව ගුණවති සේරසිංහ මිය

<u>ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා</u>ආබාධිත පුද්ගලයින්ට වැසිකිළි ආධාර ලබා දීම සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා විසින් ගෙන ආ යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් බල ප්‍රෙද්ශයේ ආබාධිත පුද්ගලයින් සඳහා වැසිකිළි ආධාර ලබා දීමේ යෝජනාව පැමිණ සිටි සියළු ගරු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.

**03. කි.වො 25 ඩීසල් විදුලි ජනක යන්ත්‍රය මිල දී ගැනීම වෙනුවෙන් ව්‍යාපෘතිය මගින් වෙන්වන මුදල ඉක්මවන ප්‍රමාණය සහා අරමුදලින් දැරීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා, කිලෝවොට් 25 ක විදුලි ජනන යන්ත්‍රයක් මිළදී ගැනීම සඳහා රුපියල් 2100.000.00ක් LDSP ව්‍යාපෘතිය යටතේ මෙම සභාව වෙත අනුමත වී ඇති නමුත් මෙම ප්‍රමාණයේ විදුලි ජනන යන්ත්‍රය වර්තමානයේ වෙළඳපොළ තුල නොමැතිකම හේතුවෙන් කිලෝ වොට් 30ක විදුලි ජනන යන්ත්‍රයක් රුපියල් 3,600.000.00කට මිළදී ගැනීමට සිදු වී ඇති බැවින් එම මිලෙහි සුළු විචලනයන් සැළකිල්ලට ගෙන එහි ඉතිරි මුදල් ප්‍රමාණය සහා අරමුදල් යොදවා ගනිමින් මිල දී ගැනීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා ප්‍රතිපාදන හිමි වූ මුදල ඉක්මවා වැය වන මුදල සහා අරමුදලින් යොදවා අදාල කිලෝවොට් 30 ක විදුලි ජනන යන්ත්‍රයක් මිලට ගැනීමේ යෝජනාව සථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් කිලෝවොට් 30 ක විදුලි ජනන යන්ත්‍රයක් මිලට ගැනීමේ යෝජනාව පැමිණ සිටි සියළු ගරු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.

**04. ප්‍රාදේශිය සභාව ඉදිරිපිට ආපනශාලාව ලෙස ඉදිකල ගොඩනැගිල්ල කුලී පදනමින් ලබා දිම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ප්‍රාදේශීය සභා භූමියේ පිහිටි මෙතෙක් තොරතුරු මධ්‍යස්ථානය ලෙස භාවිතා කල ගොඩනැගිල්ල මේ වන විට පවතින වෙළඳපල මිල ගණන් සීඝ්‍රයෙන් ඉහල යාම තුල ජනතාවගේ සුභ සිද්ධිය උදෙසා විවිධ සේවා සමූපකාර සමිතිය වෙත, මාසික කුලිය රු.5'000 බැගින් අය කර ගනිමින් ජල බිල හා විදුලි බිල එම ආයතනය විසින් ගෙවීමේ පදනම යටතේ, කුලී පදනමින් ලබා දීම සුදුස බවට යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමාඅදාල ගොඩනැගිල්ල කුලි පදනමින් ලබා දීමට අදාල ගිවිසුම සභාව වෙත ඉදිරිපත් කරන මෙන් ඉල්ලා සිටි අතර, ආදායම් ලබා ගැනීමේදී ගැටීමක් ඇති නොවීමට වග බලා ගන්නා ලෙස සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමාප්‍රාදේශිය සභාව ඉදිරිපිට ආපනශාලා ගොඩනැගිල්ල කුලී පදනම මත ලබා දීම සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා ඉදිරිපත් කල යෝජනාව සථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් මෙතෙක් තොරතුරු මධ්‍යස්ථානය ලෙස භාවිතා කල ගොඩනැගිල්ල විවිධ සේවා සමූපකාර සමිතිය වෙත, මාසික කුලිය රු.5000 බැගින් අය කර ගැනීමේ පදනම යටතේ ලබා දීමේ යෝජනාව පැමිණ සිටි සියළු ගරු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය

**05.** **සභා අරමුදලින් මාර්ග ප්‍රතිසංස්කරණය**

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> බල ප්‍රදේශයේ දැඩි ලෙස අබලන් වී ඇති මාර්ග සංවර්ධනය කිරීමට අදාල ඇස්තමේන්තු මහ සභාවට ඉදිරිපත් කරමින්එම මාර්ග සංවර්ධනය කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

| අනු අංකය | විස්තරය | ඇස්තමේන්තු ගත මුදල |
|---|---|---|
| 01 | 274 උතුරු කළුවිල 4 ඇල ප්‍රධාන මාර්ගය කොන්ක්‍රීට් කල කොටස ඉදිරියට තාර දමා වැඩිදියුණු කිරීම | 1,281,870.88 |
| 02 | 237 මහ පාලාඩිකුලම 3 වන පටුමඟ තාර දමා සංවර්ධනය කිරීම | 1,281,870.88 |
| 03 | 243 වන්නියම්කුලම සේනානායක මාවත වටරවුම සිට ශාන්ති මාවත මංසන්දිය දක්වා මාර්ගය | 1,600,788.24 |

මෙම යෝජනාව සම්බන්ධයෙන් මහ සභාවේ විවිධ අදහස් හා යෝජනා ඉදිරිපත් වූ අතර, පක්ෂ විපක්ෂ භේදයකින් තොරව,මන්ත්‍රීවරුන් දැක්වූ අදහස් මත හා රටේ පවතින ආර්ථික තත්වය සැළකිල්ලට ගෙන මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීම තාවකාලිකව අත්හිටුවීමට තීරණය කරන ලදි.

**06.ග්‍රාමීය මාර්ග සංවර්ධනය 2021 යටතේ ඉදිකල මාර්ග වල බිල්පත් වලට අදාල ගෙවීම් ලැබෙන ප්‍රතිපාදන ප්‍රමාණයන් අනුව ගෙවීම.**

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u>ග්‍රාමීය මාර්ග සංවර්ධනය 2021 යටතේ ඉදිකල මාර්ග වල බිල්පත් වලට අදාල ගෙවීම් ලැබෙන ප්‍රතිපාදන ප්‍රමාණයන් අනුව ගෙවීම සුදුසු බවට යෝජනා කරන ලදි.

<u>ගරු මන්ත්‍රී ඩී.ඒ.ජේ.එම්.කේ.ජී.ජී. කුමාරිහාමි මැතිණිය</u>ග්‍රාමීය මාර්ග සංවර්ධනය 2021 යටතේ ඉදිකල මාර්ග වල බිල්පත් වලට අදාල ගෙවීම් ලැබෙන ප්‍රතිපාදන ප්‍රමාණයන් අනුව ගෙවීමේ යෝජනාව ස්ථිර කරන ලදි.මේ වන විට මෙම මාර්ග වල වැඩ ඉතා හොඳින් නිම කර ඇත. මෙම ව්‍යාපෘති සිදු කරන කාල සීමාවේදි සිමෙන්ති මිලෙහි සිදු වූ වැඩි වීම හේතුවෙන් අදාළ කොන්ත්‍රාත් සමාගම් වලට ලාභ ඉපැයීමට පවා නොහැකි වූ බවත්, එම සිමෙන්ති යෙදීම තාක්ෂණ නිළධාරීන් ඉදිරිපිට නිසි ප්‍රමිතියට යෙදූ බවත් පැවසීය. එමනිසා 2021 දෙසැම්බර් 31 ට පෙර වැඩ නිම වූ ව්‍යාපෘති සඳහා අත්තිකාරමක් ලෙස අදාළ මුදල් ලබා දීම සුදුසු බවට ප්‍රකාශ කරන ලදි.

<u>ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා</u>මෙම යෝජනාවේ ගැටළුවක් නොමැති බවත්,2021 දෙසැම්බර් 31 ට පෙර වැඩ නිම වූ ව්‍යාපෘති සඳහා මුදල් ලබා දීම සුදුසු බවට ප්‍රකාශ කරන ලදි.

<u>ගරු මන්ත්‍රී පී.එස්.බී.සිරිවර්ධන මැතිතුමා</u>ඇත්තෙන්ම මෙම ව්‍යාපෘති සිදු කරන කාලයේ සිමෙන්ති මිල ඉහළ ගිය බවත්, එමෙන් ම කියුබ් ගල් මිල ද වැඩි වීමක් සිදු වූ බව පැවසීය. නමුත් කෙසේ හෝ මෙම ව්‍යාපෘති නිම කර මාස 6 ක් පමණ වන බවත්, මේ සඳහා සභාවෙන් ගෙවීම් කිරීම අනුමත වූ බැවින් යම් මුදලක් හෝ දැනට ගෙවීම් කරන මෙන් ප්‍රකාශ කළේ ය.

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් ග්‍රාමීය මාර්ග සංවර්ධනය 2021 යටතේ ඉදිකල මාර්ග වල බිල්පත් වලට අදාල ගෙවීම් ලැබෙන ප්‍රතිපාදන ප්‍රමාණයන් අනුව ගෙවීමේ යෝජනාව පැමිණ සිටි සියළු ගරු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.

**06.2021 වර්ෂයේ අවසන් ගිණුම් අනුමත කිරීම.**

<u>ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා</u>ගරු මන්ත්‍රීවරුන් සඳහා මෙම අවසන් ගිණුම බැලීමට වැඩපිලිවෙලක් යොදන ලෙසත්,ගරු මන්ත්‍රීවරුන් සියලු දෙනා මෙය බැලිය යුතු බවත් පැවසීය.එම අවස්ථාවේදී තවත් යෝජනා කිපයක් කළ අතර ඒවා නම්, සතියකට පුවත්පත් එකක්වත් මන්ත්‍රීවරු 3 දෙනෙකුට එක බැගින් හෝ ලබා දීමට කටයුතු කරන ලෙසට හා ප්‍රාදේශීය සභාවට තෙල් ගෙනෙන විට මහජන නියේජිතයින් වශයෙන් මන්ත්‍රී වරුන් සදහාද තෙල් ගෙනැවිත් මුදලට ලබා දෙන වැඩ පිළිවලක් සකස් කරන ලෙසට පැවසීය.එහිදී අඩුම තෙල් ලීටර් 5ක් ලබාදෙන ලෙසට ප්‍රකාශ කරන ලදි.

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u>ප්‍රාදේශීය සභාවට තෙල් ලබාගන්නේ ඕඩර් මත බැවින් මේ ආකාරයෙන් තෙල් ලබා දීම ප්‍රායෝගිකව සිදු කළ නොහැකි බව ප්‍රකාශ කරන ලදි.

**ඊ) කාරක සභාවල වාර්තා**

- 2022මැයිමස 08 වන දින මුදල් කමිටු වාර්ථාව.

**සභා ගත කරන ලදී.**

**එ) ලැබීම් ගෙවීම් මාසික වාර්තා**

2022අප්‍රේල් මස ආදායම් හා වියදම් වාර්ථා මහ සභාවේ සලකා බැලීම සිදු කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ආර්.ඩී.පී බන්දුලසේන මැතිතුමා</u>

අප්‍රේල් මාසයේ ගෙවීම් වාර්ථාවල වෙනත් ගෙවීම් වල විෂය අංකයක් අන්තර්ගත වී නොමැති බවත් තවද මෙහි සේවක ණය පිළිබදව වැඩි විස්තර නොමැති බවත්,මුදල් මාරු කිරිම පිළිබදව පැහැදිලිව සඳහන් කර නොමැති අතර එහි විෂය සංකේත අංකයක් නැති බවත් පැවසීය.වැය මාරුවක් සිදු කිරිම සඳහා සභාපතිතුමාට බලය ඇති නමුත් ,ඒ පිළිබදව මහ සභාවට දැනුම් දිය යුතු බව ද සඳහන් කරන ලදි.

**ඒ) රැස්වීම් කැදවීමේ දැන්වීම් හා වෙනත් කාරණා ඉදිරිපත් කිරීම.**

**01. නිවාඩු දැනුම් දීම.**

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u>ගරු මන්ත්‍රීපී.එස්.බී සිරිවර්ධන මැතිතුමා, ගරු මන්ත්‍රී කේ. හැරිසෙන්ස් මැතිතුමා , ගරු මන්ත්‍රී බී.බී.ඊ ගයාන් චාමර මැතිතුමා, ගරු මන්ත්‍රී කේ.ඒ සංජීව මැතිතුමා, ගරු

මන්ත්‍රීඑච්.ඩබ්.ජී.එන් කුමුදු වසන්ති මැතිනියමහ සභාවට නොපැමිණෙන බවට දන්වා යොමු කර තිබූ නිවාඩු ඉල්ලීම් මහ සභාවට ඉදිරිපත් කරන ලදී.

<u>ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා</u>අදාල නිවාඩු ඉල්ලුම් කර ඇති ගරු සභිකවරුන් වෙත නිවාඩු ලබා දීම සුදුසු බව සඳහන් කරන ලදී.

**02.** වෙනත් කාරණා

<u>ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා</u>

වර්ථමානයේ රට මුහුන දී ඇති අතිශය භයංකාර ආර්ථීක,සමාජීය හා දේශපාලන කඩා වැටීම් හමුවේ අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා විසින් එක්සත් ජාතික පක්ෂ නායක ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාට ගරු අග්‍රාමාත්‍ය ලෙස දිවුරුම් දෙන ලෙසට ඇරාධනා කල අතර එතුමා එම අභියෝගය භාරගෙන සමස්ත රට වැසියන්ටම ආදර්ශයක් සැපයූ බවට පැවසීය.එම නිසා එම ගෞරවය එතුමාට පුද කරන බවද ප්‍රකාශ කරන ලදි. එම නිසා සියලුම දේශපාලන සංවිධාන වලින් සියලු වාද භේද අමතක කර රටට සුභදායි ක්‍රියාවලියට එකා මෙන් සහය දිය යුතු බවට ද ඉල්ලා සිටින ලදි.ගරු සභාපති තුමාගෙන් ද ප්‍රාදේශීය නායකයෙකු ලෙස එම ක්‍රියාවලියට සහය දෙන ලෙසට ඉල්ලා සිටින ලදි.

<u>ගරු මන්ත්‍රී ආර්.ඩී.පී බන්දුලසේන මැතිතුමා</u>

ගියවර සභාවේදී 09 වෙනිදා සිද්ධිය සිදුවන බව පැවසූ,නමුත් සභා වාර්ථාවේ එය අන්තර්ගත වී නොමැති බවට ප්‍රකාශ කරන ලදි.එදා පැවසූ ආකාරයට සමසගි ජන බලවේගයේ නායක ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා අගමැති වුනානම් එදා  සිදුවීම නොවෙන්න ඉඩ තිබුණු බවත් පැවසීය.නමුත් සභාවක් ලෙස කැමැත්තෙන්  හෝ අකමැත්තෙන් ගරු අගමැති රනිල් වික්‍රමසංහ මැතිතුමා පිලිගත යුතු බවත්, ගිය වර ප්‍රකාශ කල ආකාරයට රජයක් පෙරලන්නෙ නැති බවත් නමුත් ආණ්ඩුව පෙරලන්න කටයුතු කරන බවත් පැවසීය.එහිදී රට වට්ටන් නැතුව තීරණ ගත යුතු බවත් සමහර ප්‍රාදේශීය නායකයින් (සභාපතිතුමනි ඔබතුමා හැර ) එදා  ගොස් ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාට ඉවත් නොවන ලෙසට පැවසූ නිසා එවන් තත්වයක් ඇති වුනු බවත් පැවසීය.එහිදී ගරු සභාපතිතුමා නොගිය එකට ස්තූතිවන්ත වන බව ද පැවසීය.

ඇත්තෙන්ම ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා කියන්නෙ පිළිම නෙළලා වන්දනා කළ යුතු අයෙක් බවත් එතුමා යුද්දෙ දිනලා දුන් බව හා  රටට විශාල සේවයක්  කළ බවට ද පැවසීය.නමුත් පසුකාලීනව ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ හා අන් අයගේ වැඩ නිසා ,එතුමට තිබුණු ගෞරවය අද නැති වී , එවන් තත්වයක් නිසා එදා එම පාක්ෂිකයින්ට බේරේ වැවේ බස්සවා පහර දීමකට ලක් කරන්න තරම් ජනතාව අමානුෂික වුනු බවත් පැවසීය.මේ සිදුවීමත් සමග මෙම සභාවේ විපක්ෂයේ මන්ත්‍රීවරුන් ජනතාව කුපිත කර ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රී වරුන්ගේ නිවෙස් කරා නොයැව්ව නිසාඔවුන්ට ස්තූති වන බව ද පැවසීය.

<u>ගරු මන්ත්‍රී පී.ටී.සිරිසේන මැතිතුමා</u>

දැන් රට ජාතික ප්‍රශ්නෙකට මුහුණ දී ඇති අතර,එහිදි අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා සියලුම පක්ෂවලට කවුරු හෝ පැමිණ භාර ගන්නා ලෙසට ආරාධනා කල බවත්,  එහිදි එම අභියෝගය භාරගෙන පැමිණි ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාට ස්තූතිය පුද කරන බව ද පැවසීය.දැන් එතුමන්ලා දැවැන්ත වැඩපිළිවෙලක් රට වෙනුවෙන් කිරිමට සූදානම් කරන  අතර එහිදි මෙම ප්‍රාදේශීය සභාවේ ආණ්ඩුව නියෝජනය කරන සියලුම මන්ත්‍රීවරුන්ගේ සහය ලබාදෙන බව ද ප්‍රකාශ කරන ලදි.එමෙන්ම රටේ පවතින මෙම වැඩ වර්ජන නතර කරන ලෙසත්  මේ අවස්ථාවේ රට ගොඩ ගෙන ඉන්පසු ඒවා ඉල්ලීමට කටයුතු කරන ලෙසත් පැවසීය.අවසන් වශයෙන් තමාගේ නායකයාගේ කීමට එරෙහි නොවන බව ද එතුමා පැවසීය.

<u>ගරු මන්ත්‍රීඑස්.ඒ.කේ.පී ගුණවර්ධන මැතිතුමා</u>

අද රට අපරාජිත තත්වයකට පත්වෙලා තිබෙන අතර , ගියවර මෙය ප්‍රකාශ කරත් සභා වාර්තාවේ එය අන්තර්ගත වී නොමැති බව පැවසීය.නමුත් ඔවුන් පැවසූ ලෙසට එය ඒ ආකාරයෙන් සිදු උනු බව ද මෙම ගැටළුව ප්‍රාදේශීය මට්ටම් දක්වා ව්‍යාප්ත වුනු බව ද පැවසීය .එහිදී මෙම ගැටළුව තමන්ගේ පක්ෂ නායකත්වයටත් දන්වා වළක්වා ගන්නා ලෙසටත් ඔවුන් ප්‍රකාශ කළ බව පැවසීය. මේ සිදුවීම පිටුපස ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා හා ඒ කණ්ඩායම සිටින බවත්,මේ නිසා එම පාක්ෂිකයින්ට එදා බොහෝ ගැටළු වලට මුහුණ දෙන්න සිදුවුණු බවත් ප්‍රකාශ කරන ලදි. මේ හා සම්බන්ධ එම පාක්ෂකයින්,එම ස්ථානයට යන තෙක් එවැනි සිදුවීමක් සිදුවන බව දැන සිටියේ නොමැති බව ද ප්‍රකාශ කරන ලදි.මේ ගැටළුකාරී තත්වයක් ඇතිවීමට පෙලඹීම සිදුවූයේ එහි ගිය පසුව බවත්,ඔවුන් මේ තත්වය කලින් දැන සිටියානම් ,මේ ගමන වෙත සම්බන්ධ නොවන බවත් , මන් ද ඒ ජනතාවත් ගෑස් පෝලිම්,තෙල් පෝලිම්,ආදී ගැටළු වලට මුහුණ දුන් ජනතාවම බවත් පැවසීය.

එදා රනිල් වික්‍රමසිංහ මැතිතුමා මහ බැංකුව හොරා කෑවා යනුවෙන් ප්‍රකාශ කළ පිරිසම අද එතුමන්ව අගමැති ලෙස පත් කළ ඇති බවත්, රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ ඉතිහාසය ගත් විට ,එතුමා 1977 පාර්ලිමේන්තුවට පත් වී අධ්‍යාපන ඇමති බවට පත් වී එහිදී අධ්‍යාපන පෞද්ගලිකරණය කිරිමට එතුමන් පියවර ගැනීමට කටයුතු කළ අතරශිෂ්‍ය ව්‍යාපාර සහ වාමාංශික ව්‍යාපාර එකතු වී මෙය පරාජය කළ බවත් පැවසීය.පසුවත් මෙතුමන් කලේ විකිණීම බවත් ඊයේ දිනයේදී සිදු කළ ප්‍රකාශයේදීත් ,එතුමාගේ අරමුණ විකිණීම බව පැහැදිලි වන බව ප්‍රකාශ කරන ලදි. මේ ආකාරයෙන් නව අගමැති කෙනෙක් පත් කර සිදුකළ ඇත්තේ ඉත්තෙක් ඇදීමක් වන අතර ඒ තුලින් රටට යහපතක් සිදුනොවන බවත්,ටික දිනකට විරෝධය අඩුවීමක් පමණක් සිදු වී තව දුරටත් තෙල් මිළ ඉහල යන බවත් පැවසීය.ඉදිරියේදී මෙම මන්ත්‍රීවරුන්ටද පාරට බැස ඉල්ලීම් කරන්න සිදු වෙන බවත් එම නිසා දැන්වත් නොරැවටී ,පාට කණ්ණාඩි ගලවා වෙන දේ තේරුම් අරන් ජීවත් වෙන්න යනුවෙන් ප්‍රකාශ කරන ලදි.

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u>අදහස් දැක්වීම හා තීන්දු තීරණ ගැනීම වෙනුවෙන් සහයෝගය දැක්වූ ගරු මන්ත්‍රිතුමන්ලා වෙත හා ගරු මන්ත්‍රිතුමියන්ලා වෙත ස්තූතිය පුද කරන ලදි. එතුමන් ඉතිහාසය පිළිබඳවත් දන්නා බවත්,මෙම භීෂණකාරී සංස්කෘතිය රටකට හොද දෙයක් නොවනෙ බවත් පැවසීය. මේ තත්වය මතහෙට දවසේදී සිදුවන්නේ,දොස්තරගෙන් බෙහෙත් ගෙන ලෙඩා මැරුණොත් දොස්තරට පහරදෙන ප්‍රචණ්ඩකාරී සංස්කෘතියක් බව හා මේ තත්වය වළක්වා ගත යුතු බව පැවසීය. නැතිනම් දූවා දරුවන්ට හෙට දිනයේදී සිදුවන්නේ, ලේ විලක් හා ගිනිදැල් මත යැපීමට බවත්,එම නිසා පාට අයින් කරගෙන සියළු දෙනා එකට එකතු වී මෙම අර්බුධයට මුහුණ දිය යුතු බව ද පැවසීය.මෙහිදී රටේ පවතින තත්වය මත නව අගමැති ලෙස පත් වූ රනිල් වික්‍රමසිංහ මැතිතුමාට එතුමාගේ සුභාෂිංශනය එක් කරමින් 2022.05.17 වන දින පැවැත්වූ මහ සභා රැස්වීම ප.ව 11.45ට අවසන් කරන ලද අතර එළබෙන මහ සභාව 2022.06.17 වන දින පෙ.ව 10.00 පැවැත්වෙන බව සඳහන් කරන ලදී.

.................................. ..........................................

බී.එච් ප්‍රදීප් නිශාන්ත,
ලේකම්,
නෑ.නු.ප ප්‍රාදේශීය සභාව,
විජයපුර.

එස්.බී කුමාරදාස,
සභාපති ,
නෑ.නු.ප්‍රාදේශීය සභාව,
විජයපුර.